මතුගම අධ්‍යාපන කලාපය
දෙවන වාර ඇගැයීම් වැඩසටහන 2020

8 ශ්‍රේණිය **බුද්ධ ධර්මය - පිළිතුරු**

I පත්‍රය

(1)	-	4	(11)	-	1
(2)	-	3	(12)	-	2
(3)	-	2	(13)	-	1
(4)	-	1	(14)	-	2
(5)	-	3	(15)	-	1
(6)	-	2	(16)	-	2
(7)	-	4	(17)	-	1
(8)	-	1	(18)	-	1
(9)	-	2	(19)	-	2
(10)	-	4	(20)	-	1

- එක් පිළිතුරකට ලකුණු 2ක බැගින් මුලු ලකුණු 40 කි.

II පත්‍රය

01 (i) උපාලි ගෘහපති
(ii) සුහදතාව / හිතවත්කම / සවන්දීමේ ගුණය / අන්‍යයින්ට වටහා ගැනීමට සැලැස්වීම.
(iii) වේලුද්වාර සූත්‍රය
(iv) මිහිඳු හිමියන් මෙරටට දායාද කළ ථේරවාදී බුදු දහම
(v) දුටුගැමුණු රජතුමා
(vi) දකුණු ඉන්දීය හා හින්දු ගෘහ නිර්මාණ සම්ප්‍රදාය
(vii) සමනල කඳු මුදුනෙහි
(viii) ශ්‍රී පාදස්ථානය වන්දනා මාන කිරීම / වෙසක් උත්සවය සැමරීම / නත්තල් / දීපවාලි / රාමසාන්

02. (i) සුවදශීලී කතා බහ / ආගන්තුක සත්කාරය / මහජන මතයට ගරු කිරීම / අල්ප ශබ්දතාව / නිහතමානී බව
(ii) ගුරු බස සැබෑමය - එය පිළිගැනුම යුතුමය
පඩි බසත් එයමය - එයින් දෙලොවෙහි මහත් සැපමය
(iii) ආචාරශීලී ගුණාංගයන් තුනක්වත් ලියා එයට උදාහරණ මෙන්ම එය තමාගේ ජීවිතයට සම්බන්ධ කර ගන්නා ආකාරයට කෙටියන් විස්තර කර තිබේ නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.
උදා - බුදුරජාණන් වහන්සේ ඉතා සුහදශීලීව, ආචාරශීලීව සෝණදණ්ඩ බමුණව පිළි ගැනීම.
තමා හමුවට එන මිතුරකු පිළිගැනීම හෝ තමන් තැනකට ගියවිය සුහදශීලීව ආචාරශීලීව කටයුතු කිරීම.

03. (i) හයක්

(ii) ස්වාක්ඛාතෝ භවතා ධම්මෝ / සන්දිට්ඨිකෝ / අකාලිකෝ / ඒහි පස්සිකෝ / ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී

(iii) පිටු අංක 19, 20 – 8 ශ්‍රේණිය බුද්ධ ධර්මය

04. (i) සිරිත් විරිත් කළ යුතු දේ වන අතර විරිත් යනු නොකළ යුතු දේ ය.

(ii)

සිරිත	විරිත
ආගන්තුකයින්ට බතබුලතින් සංග්‍රහ කිරීම.	මත්පැන්වලින් සංග්‍රහ කිරීම.
ආහාර පානවලින් සංග්‍රහ කිරීම.	ප්‍රිය සම්භාෂණ පැවැත්වීම.
ආගමික ස්ථානවල හිස්වැසුම් පාවහන් ගැලවීම.	පාවහන් නොගැලවීම.
ආයුබෝවන් යැයි කීම.	අතට අත දීම.
සරල චාම් උත්සව පැවැත්වීම.	සංකීර්ණ උත්සව පැවැත්වීම.

(iii) ස්වාමීන් වහන්සේට දිනය හා වේලාව සහිතව දන්වා ආරාධනා කිරීම.

අදාළ දින තෙල්, මල් හඳුන්කූරු වැනි පූජා භාණ්ඩ සකස් කර ගැනීම.

මව පියා වැඩිහිටියන් යහළුවන් වැඩි අයට සහභාගිවන ලෙස දැන්වීම.

අදාළ දින සුදු ඇඳුමින් හෝ චාම් ඇඳුමකින් සැරසී විහාරස්ථානයට යාම.

පූජා භාණ්ඩ බෝධි පූජාවට ගැළපෙන අයුරින් සකස් කිරීම.

ස්වාමීන් වහන්සේ ආරාධනා කිරීම.

විහාර මළුව බෝමළුව අවට පිරිසිදු කිරීම.

බෝධි පූජාව අවසානයේ ස්වාමීන් වහන්සේ පිරිකරක් පූජා කිරීම යනා දී කරුණු ඇතුළත් කර තැබිය යුතු ය.

05.(i) කෝලිත - උපතිස්ස

(ii) නොමග ගිය දේවදත්ත වැනි භික්ෂූන් සුමගට ගැනීම.

මච්ඡරිය කෝසිය සිටුතුමා මසුරුකමින් මුදවා ගැනීම.

නන්දෝපනන්ද නාගරාජය දමනය කිරීම.

මාරයා දමනය කිරීම.

පින් පව්වල ප්‍රතිවිපාක ජනතාවට දේශනා කිරීම.

දෙව්ලොව තොරතුරු හා විස්තර දක්වමින් ධර්ම දේශනා පැවැත්වීම.

(iii) කරන කියන හැම දෙයක් ගැනම විමසිලිමත්වීම.

විනෝදවීම පමණක් ජීවිතයේ පරමාර්ථය ලෙස නොසැලකීම.

පොරොන්දු නිසිපරිදි ඉටුකිරීම.

කුඩා කළ ඉගැන්වූ ගුරුවරුන්ට ගෞරව දැක්වීම.

ගුරු ගෞරවරයට හේතුවන අයුරින් තම දක්ෂතා ගොඩ නගා ගැනීම.

තම හිතවතුන් නොමග ගිය අවස්ථාවේ යහමගට ගැනීමට යම් යම් දේ කිරීම.

පුංචි හෝ පවක් කිරීමට නොකර සිටීමට උත්සාහ දැරීම

තම දෙමාපියන්ගේ ආගමික ලැදියාව වර්ධනය කිරීමට කටයුතු කිරීම.

06. (i) කය හා වචනය සංවර කර ගැනීම ශීලයයි.

(ii) පාණාතිපාතා වේරමණේ සික්ඛා පදං සමාධියමි.

අදින්නාදානා වේරමණේ සික්ඛා පදං සමාධියමි.

කාමේසුමිච්ඡාචාරා වේරමණේ සික්ඛා පදං සමාධියමි.

මුසාවාද වේරමණේ සික්ඛා පදං සමාධියමි.

සුරාමේරය මජ්ජටමාදට්ඨානා වේරමණේ සික්ඛා පදං සමාධියමි.

(iii) කය හා වචනය දෙක සංවර කර ගැනීම ශීලය වන බව

කයින් කෙරෙන හා වචනයෙන් කෙරෙන වැරදිවලින් ඈත්වීම.

සීල ශික්ෂාව නිවන් කුසලතාව වර්ධනයට හේතු වන බව

අල්පේච්ඡ ජීවිතයකට හුරුවීම.

අත්හැරීමේ ගුණය ප්‍රගුණ කර ගත හැකිය.

07. (i) ඉපදීම / ලෙඩවීම / මහළුවීම / ප්‍රියයන්ගෙන් වෙන්වීම / අප්‍රියන් සමග එක් වීම / කැමති දේ නොලැබීම / මරණය

(ii) දුක්ඛ දුඛ්‍ය සත්‍යය (සාමාන්‍ය දුක)

විපරිනාම දුක්ඛ (වෙනස්වීම පිළිබඳ දුක)

සංකාර දුක්ඛ (සංස්කාර දුක)

(iii) කාම තණ්හා යනු, කම්සැප විඳීමට ඇති කැමැත්තයි. මෙහි ප්‍රභේද 3 කි.

1. කාම තණ්හා - කම්සැප විඳීමට ඇති කැමැත්ත/ඉදුරන් පිනවීමට ඇති කැමැත්ත
2. භව තණ්හා - නැවත නැවත ආත්මභවයන්හි ඉපිද සැපවීඳීමට ඇති කැමැත්ත
3. විභව තණ්හා - නැවත ඉපදීමක් නැතැයි සිතා උපන් ආත්ම භාවයේ දී හැකිතාක් කම්සැප විඳීමයි.

මේ ආදී කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.